# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) ප්‍රමිත අංක 1 | (i) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් ලෙස දැක්විය යුතු පාර්තෝෂික දීමනා සඳහා වෙන්කිරීම ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි. |
| | (ii) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන තේරුම් ගැනීම වඩා පහසු වන ලෙස මුදල් වටිනාකම ආසන්න රුපියල් වලින් දැක්වීම වඩා සුදුසු වුවද, සංස්ථාව එසේ කර නොතිබුණි. |
| | (iii) | නව ගිණුම්කරණ ප්‍රමිත අනුව 2012 ජනවාරි 01 දින සිට මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව ගිණුම් සකස් කර නොතිබුණි. |
| (ආ) ප්‍රමිත අංක 8 | | චිත්‍රපට සැපයුම්කරුවන් සඳහා වෙන්කිරීම් රු. 2,000,000 ක් හා එකඟතාවයට නොපැමිණි කරුණු සඳහා වෙන්කිරීම් රු.5,600,000 ක් ගිණුම්වලින් ඉවත් කිරීමේදී, සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපිය යුතු වුවද, එය විසර්ජනය නොකළ ලාභ අලාභ ගිණුමට ගලපා තිබුණි. |

(ඇ) ප්‍රමිත අංක 17 — මෙහෙයුම් කල්බදු ගිණුම් තැබීමේදී කල්බදු ගෙවන්නා හෙළිදරව් කළ යුතු තොරතුරු ගිණුම් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ප්‍රමිත අංක 18 — සංස්ථාව විසින් සේවක ණය පොලිය ගැලපීම් කළ බව දක්වා ඇතත් ණය පොලිය ගැලපීමේදී සලකා බැලිය යුතු එක් එක් සේවකයාට ලබාදී ඇති ණය මුදල, වාරික ගණන, අදාල දිනට ගෙවිය යුතු ශේෂය, ණය මුදලෙහි සාධාරණ අගය, දේශීය ණය පොලී අනුපාතය යනාදිය සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඉ) ප්‍රමිත අංක 24 — ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණයට බලපෑම් කළ හැකි සියළුම සම්බන්ධිත පාර්ශවයනගේ සම්බන්ධතාවයන් ඔවුන් මූල්‍ය ගනුදෙනුවකට සම්බන්ධ වුවත් නැතත් ගිණුම්වල හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාව විසින් එම හෙළිදරව් කිරීම කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

කල්බදු පහසුකම් යටතේ 2010 වර්ෂයේදී මිලදී ගත් වාහනයක ගත්මිල හා කල්බදු පහසුකම් පිළිබඳව නිවැරදිව ගිණුම් තැබීමක් සිදුකර නොතිබුණි. වාහනයේ ගැණුම් මිල නිවැරදිව සටහන් නොකිරීම නිසා වාහන ගිණුම රු. 1,179,864 ක් හා වාහන ක්ෂය වෙන්කිරීම් ගිණුම රු. 182,640 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

(අ)

| | විස්තරය | පාලන ගිණුම/උපයෝගී ගිණුම | උපලේඛනය | නොසැසඳු වටිනාකම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | භාණ්ඩාගාර බිල්පත් පොලිය | 5,670,573 | 4,991,555 | 679,018 |
| (ii) | විත්‍රපට කුලී ණයහිමි පාලන ගිණුම | 94,118,580 | 142,118,064 | 47,999,484 |
| (iii) | සංස්ථා සේවක ණය | 19,789,722 | 22,181,377 | 2,391,655 |

(ආ) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා ගිණුම අන්තර් දෙපාර්තමේන්තු ගනුදෙනු සටහන් කරනු ලබන ජංගම ගිණුමක් වූ අතර, එහි ආරම්භක ශේෂය රු. 120,087,374 ක් හා අවසන් ශේෂය රු. 110,785,369 ක් වශයෙන් දක්වා තිබුණි. නමුත් ඊට සමාන්තරව පවත්වාගෙන යනු ලබන චිත්‍රපට බෙදාහැරීමේ මණ්ඩල ගිණුමට එම ශේෂ ගැලපූ පසු තවදුරටත් පැවතී ශේෂය රු.1,333,370 ක් විය. ඒ අනුව අදාල ජංගම ගිණුම් සැසඳීමට පියවර ගෙන නොතිබුණි. තවද 2011 දෙසැම්බර් 31 දිනට රත්මා මණ්ඩල ශේෂ පිරික්සුම අනුව ශ ලංකා ජාතික චිත්‍රපට සංස්ථා ගිණුමේ අවසන් ශේෂය රු. 84,017,406 ක් වෙනුවට 2012 ජනවාරි 01 ආරම්භක ශේෂය ලෙස රු. 120,087,375 ක් වුයෙන් රු. 36,069,968 ක වෙනසක් තිබුණි.

## 1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

සිනමා ශාලා ණයගැති පාලන ගිණුම ලෙජරයට අනුව රු. 221,634,318 ක් වූ අතර උපලේඛනයට අනුව රු. 227,154,750 ක් වුයෙන් රු. 5,520,432 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.2.5.1 ලැබිය යුතු ගිණුම්

**(අ) නිෂ්පාදන ණයගැතියන්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) රු. මිලියන 109 පමණ වු නිෂ්පාදන ණයගැතියන් තුළ වර්ෂ 5 ඉක්මවු ණයගැතියන් ප්‍රමාණය රු. මිලියන 50 ක් හෙවත් සියයට 46 ක් විය. වර්ෂ තුන ඉක්මවූ ණයගැතියන් ප්‍රමාණය රු. මිලියන 63 ක් හෙවත් සියයට 58 ක් විය. මෙම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ii) නිෂ්පාදන ණයගැති පාලන ගිණුම අනුව නිෂ්පාදන ණයගැති හර ශේෂය රු. 107,466,956 ක් වු අතර එම අගයට චිත්‍රපට කුලී ණයහිමි උපලේඛනයේ රු. 9,063,983 ක් වූ හර ශේෂය හා විවිධ ණයගැති උපලේඛනයේ රු. 1,603,437 ක් වූ බැර ශේෂය එකතු කර තිබුණි. නිෂ්පාදකයන් වෙත ලබාදී ඇති ණය මුදල් සඳහා අයවිය යුතු පොලිය ණයගැතියන්ට එකතු කර එම පොලිය සියයට 100 නොලැබේය යන පදනම මත සියයට 25 ක් පමණක් ආදායමට ගෙන ඉතිරි සියයට 75 අඩමාණ පොලි වෙන්කිරීමේ ගිණුමක ඇතුළත් කර තිබුණි.එම වෙන්කිරීමේ ගිණුමේ තිබු බැර ශේෂය රු.4,618,806 ක් විය.

**(ආ) සිනමාහල් ණයගැතියන්**

2001 වර්ෂයේ සිනමාශාලාවල චිත්‍රපට බෙදාහැරීම පෞද්ගලික මණ්ඩලවලට පැවරීමට පෙර එහෙත් දැනට වසා දමා ඇති සිනමා ශාලා 138 කින් අයවිය යුතු හිඟ මුදල් 2012 දෙසැම්බර් 31 දිනට රු.7,785,561 ක් විය. තවද, දැනට ක්‍රියාත්මක වන මණ්ඩලවලට අයත් සිනමාශාලා 150 කින් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු. 142,308,228 ක් විය. එසේම සිනමාශාලා 21 කට සංස්ථාව විසින් ගෙවිය යුතු මුදල රු. 785,354 ක් විය.

**(ඇ) කාර්ය මණ්ඩල ණයගැතියෝ**

ණය උපලේඛනය අනුව 2012 වර්ෂයේදී ණය වාරික අයකරගැනීමක් සිදුනොකරන ලද නිළධාරියකුට අදාලව රු. 199,062 ක් වූ පැරණි ණය ශේෂයන් පැවතුණි.

**(ඇ) බොල්ණය වෙන්කිරීම**

සමාලෝචිත වර්ෂය අවසානයට සිනමාහල්, නිෂ්පාදන, වෙනත් ණය හා සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතුව රු. 302,449,856 ක් අයකර ගැනීමට තිබුණි. එම ණයගැතියන්ගෙන් එකඟ නොවූ හා අයකර ගත නොහැකි ණය ශේෂය ලෙස රු. 83,709,000 ක් සඳහා බොල්ණය ප්‍රතිපාදනය සියයට 100 ක් ද ඉතිරි ණය ගැතියන්ගෙන් සියයට 5 ක බොල්ණය ප්‍රමාණය රු. 9,875,300 ක් වීමෙන් මුළු බොල්ණය ප්‍රතිපාදනය රු. 93,584,300 ක් විය. මේ අනුව සංස්ථාවේ ණයගැතියන් ගෙන් සියයට 31 ක් ණය ආපසු අයකර ගැනීමට නොහැකි පදනම අනුව කටයුතු කර තිබුණි.

**1.2.5..2 ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 49,996,024 ක් වු විවිධ ණයහිමියන් තුළ වසර 5 ක් ඉක්මවු රු. 5,468,818 ක ණයහිමි ශේෂයක් වු අතර ඒවා කපාහැරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු. 151,182,047 ක් වු චිත්‍රපට කුලී ණයහිමියන්ගෙන් රු. 33,443,717 ක් එනම් සියයට 22 ක් වර්ෂ 5 කට වඩා පැරණි ශේෂයන් විය.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල තිබූ පහත දැක්වෙන එක් එක් අයිතමයන් ඉදිරියෙන් දැක්වෙන සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | ගිණුමේ විස්තරය | වටිනාකම | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | හිමිකම් නොපෑ වේතන | 1,297,508 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ii) | ලැබිය යුතු තැන්පතු | 906,228 | තැන්පතු කුවිතාන්සි, ශේෂ තහවුරුකිරීම් |
| (iii) | සුභසාධක සංගමයට අත්තිකාරම් | 161,440 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (iv) | 2012 සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකාර්සැලැස්මට අනුව සංස්ථාව විසින් කරන ලබන කාර්යයන්හි ප්‍රගතිය | ගණනය කළ නොහැක | ප්‍රගතිය පිළිබඳ තොරතුරු |
| (v) | ඉදිකිරීම් කොන්ත්‍රාත් | 43,832,996 (ගිවිසුම්ගත වටිනාකම) | විගණනයට අවශ්‍ය වූ තොරතුරු |

### 1.2.7 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 5 වන වගන්තිය | චිත්‍රපට ආනයනය කිරීම සඳහා ණය මුදල් ලබා දිය නොහැකි වුවත් දෙමළ චිත්‍රපටයක් ආනයනය කිරීම සඳහා රු. 5,000,000 ක ණය මුදලක් ලබා ද තිබුණි. තවද ගිවිසුම් ප්‍රකාරව එම මුදල් ආපසු අයකර ගෙන නොතිබූ අතර නියමිත පොලී මුදල් ද ගණනය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය (ආ) හා 2000 ජුනි 12 දින හා අංක පීඑෆ් / පීර් / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වටිනාකම රු. 35,395,774 ක් වු ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය | |
| | (i) උපවගන්ති අංක 13.2 | රාජකාරි ආවරණය සඳහා ගෙවීම් නොකළ යුතු වූවත් ඊට පටහැනිව JM කාණ්ඩයේ රාජකාරි ආවරණය වෙනුවෙන් වාර්ෂිකව රු. 9,000 ක්, MA1 කාණ්ඩයේ නිලධාරියකු හට ගෙවීම් කර තිබුණි. |
| | (ii) උපවගන්ති අංක 13:3 | වැඩබැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වූවත් වැඩබැලීමේ පත්කිරීම සඳහා දීර්ඝ කාලීනව ගෙවීම් සිදුකර තිබුණි. |
| | (iii) උපවගන්ති අංක 13:4 | පුරප්පාඩු වී තිබෙන තනතුරක වැඩබැලීම සඳහා එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් නොලත් නිලධාරියකු පත් නොකළ යුතු වූවත් ඊට පටහැනිව නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (මෙහෙයුම්) හා නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (මුදල්) යන තනතුරුවලට පත්කර රු. 111,089 ක් වැඩබැලීමේ දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.371 | අත්තිකාරමක් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතුය. එසේ වුවත් වසර 1-12 දක්වා කාල පරාසයකට අයත් රු.3,404,707 ක අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. |
| (ඉ) | සංස්ථා චක්‍රලේඛ අංක ඔඩී/පීර්එන්/01 හා ඔඩී/පීර්එන්/96 | සංස්ථාවට අයවිය යුතු චිත්‍රපට කුලිය දිනපතා ගෙවිය යුතු අතර චිත්‍රපට කුලිය සඳහා සංස්ථාවට දෛනිකව බැර කළ යුතු මුදල් බැර නොකිරීම සම්බන්ධව සියයට 5 අධිභාරයක් අයකල යුතුය. මෙම චක්‍රලේඛයට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධව හරපත්‍ර නිකුත් කිරීමක් සිදු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 64,795,810 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ වූ බදු පූර්ව ශුද්ධ අලාභය රු.72,582,062 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන ප්‍රදානයන් වශයෙන් පිළිවෙලින් රු. 68,308,000 හා රු.75,000,000 බැගින් ලැබුණු අතර එම බලපෑම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ලාභය පිළිවෙලින් රු. 3,512,190 ක් හා රු. 2,417,938 ක් විය.

### 2.2 සංස්ථාවට එරෙහිව/එදිරිව ගොනු කරන ලද නඩු

1980 පෙබරවාරි 19 දිනැති ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව, රාජ්‍ය ආයතනවල නෛතික වැඩ කටයුතු සඳහා නීතිපතිවරයාගේ සේවය ලබාගතයුතු වුවද, සංස්ථාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර නඩු 06 ක් වෙනුවෙන් බාහිර නීතිඥයින්ට නීතිඥ ගාස්තු වශයෙන් දරන ලද වියදම රු. 507,010 ක් විය. එසේම සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 02 ක් පවරා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

(අ) චිත්‍රපට ණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය මුදල් ලබා දී වසර 5 ක් ඉක්මවූ නමුත් ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් නොකළ චිත්‍රපට 26 ක් සඳහා ලබා දී ඇති ණය මුදල රු. 5,418,426 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 උනට රු. 4,229,646 ක් හෙවත් සියයට 78 ක් අයවිය යුතුව තිබුණි.

(ii) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබාදී වසර 5 කට වැඩි හා ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 49 ක් සඳහා ලබාදී තිබූ රු. 63,598,321 ක් වූ ණය මුදලින් රු. 28,472,305 ක් හෙවත් සියයට 45 ක් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි.

(iii) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබාදී වසර 5 කට අඩු හා ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 07 ක් සඳහා ලබාදී තිබූ රු. 15,611,384 ක් වූ ණය මුදලින් රු. 5,207,998 ක් හෙවත් සයයට 33 ක් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි.

(iv) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබාදී වසර 5 කට අඩු හා ප්‍රදර්ශනය සඳහා මුදා නොහල චිත්‍රපට 29 ක් සඳහා ලබා දුන් රු.28,032,604 ක් වූ අතර එම මුළු ණය මුදලම 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි.

**(ආ) සිනමාශාලා සඳහා ණය ලබාදීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව 2003 වර්ෂයේදී සිනමාශාලාවක් සඳහා රු.1,100,000 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානවන විටත් ගිවිසුම් අත්සන් කිරීමක් සඳුකර නොතිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු. 709,771 ක් විය.

(ii) සිනමාශාලා දහයක් නවීකරණය සඳහා ලබාදී තිබුණු රු. 14,612,682 ක ණය මුදලින් රු.9,103,302 ක් සිනමාශාලා 07 ක් නවීකරණය සඳහා 2012 වර්ෂයට පෙර ලබාදී තිබුණ ණය වූ අතර එයින් රු. 6,778,864 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සනමාශාලා 07 කින් රු. 2,349,090 ක් අයකරගෙන තිබුණ අතර සිනමා ශාලා 03 කින් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය සමඟ එළැඹි කුලී ගිවිසුම ප්‍රකාරව ජලය හා විදුලි බිල්පත්වල ගාස්තුවෙන් සියයට 50 ක් බදු ගැණුම්කරු විසින් දැරිය යුතු වුවද, සංස්ථාව විසින් බදුගැණුම්කරු විසින් දැරිය යුතු රු. 891,615 ක වියදමද දරා තිබුණි.

(ආ) නියමිත දිනට සංස්ථාවට ගෙවා නොමැති චිත්‍රපට කුලී හා සංස්ථා භාරය වෙනුවෙන් අයකරනු ලබන අධිභාරය සියයට 2.5 ක් ලාභාලාභ ගිණුමෙහි අධිභාර ආදායම් ලෙස රු. 3,412,270 ක් දක්වා ඇතත් 2012 වර්ෂය තුල කිසිදු අධිභාර ආදායමක් ලැබී නොතිබුණි.එම ආදායම් අයකර ගැනිමට සුදුසු වැඩ පිළිවෙලක් සකස්කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්‍රමිකතා හේතුකොට ගෙන සිනමාශාලාවලින් අයකර ගතයුතු වූ පෙර වර්ෂවලට අදාලව අධිභාර වෙන්ව හඳුනාගත හැකි පරිදි ගිණුම්ගතකර නොතිබුණි. තවද, සංස්ථාවේ පරීක්ෂණ අංශය විසින් අනාවරණය කරගත් අක්‍රමිකතා සඳහා 2012 වර්ෂය තුළදී රු. 347,610 ක් වටිනා හරපත් 100 ක් නිකුත් කරතිබුණද හරපත් 64 කින් අයවිය යුතු රු. 297,040 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දළුගම කන්ට්‍රාස් සිනමා ශාලාවේ ප්‍රතිසංස්කරණය සඳහා රු. 1,231,452 ක් සංස්ථා මුදලින් වැයකර තිබූ අතර එම මුදලින් රු. 130,501 ක් සමාලෝචිත වර්ෂයේ ලාභ අලාභ ගිණුමට හර කර තිබුණි. ඒ අනුව එම මුදල් චිත්‍රපට ශාලා සංවර්ධනය සඳහා දෙනු ලබන ණය ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර එම ණය අය වී ඇති බවක්ද නිරීක්ෂණය නොවුණි.

## 3.4 සෙමින් චලනය වන, නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2012 ජනවාරි 20 දින සිනමා ශාලා නවීකරණය කිරීම සඳහා ණය පහසුකම් යටතේ සිනමා ශාලා වෙත ලබාදීමට DTS ශබ්ද උපකරණ යන්ත්‍ර 5 ක් මිලදීගෙන තිබුණි. එම ශබ්ද උපකරණවලින් 02 ක් පමණක් සිනමාශාලා නවීකරණ කිරීමේ ණය පදනම යටතේ සිනමා ශාලා දෙකක් වෙත ලබා දී තිබුණි. ඉතිරි ශබ්ද උපකරණ යන්ත්‍ර 03 වර්ෂයක් ගත වී ඇතත් සිනමා ශාලා සඳහා ලබාදීමට කටයුතු නොකර නිෂ්ක්‍රියව පවතින අතර එම තොගයේ වටිනාකම රු.10,592,257 ක් විය. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරමින් පවතින බව සභාපතිවරයා විසින් විගණනයට දන්වා එවා තිබුණි.

## 3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලය තුළ විධායක ශ්‍රේණියේ තනතුරු 22 ක් හා සහායක සේවාවල තනතුරු 22 ක් පුරප්පාඩුව පැවති අතර, සුළු හා වෙනත් සේවාවල නිලධාරීන්ගේ අතිරික්තය පිළිවෙලින් 06 ක් හා 09 ක් විය.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය තුළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වෘත්තිය) තනතුරක් නොතිබියදී එම තනතුරේ වැඩබැලීම සඳහා නිළධාරියකු පත්කර වැඩබැලීමේ දීමනාවක් ගෙවීම අනුමත කර තිබු නමුත් එවැනි පත්කිරීමක් සිදු කිරීමට හා එවැනි ගෙවීමක් සිදුකිරීමට අවශ්‍ය සුදුසුකම් දැක්වීමක් අදාල අධ්‍යක්ෂ මණ්ඩල සංදේශය මගින සිදු කර නොතිබුණි. එවැනි ඇගයීමක් සිදුකිරීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මෙම අනුමැතිය ලබාගෙන තිබුණි.

## 3.6 වාහන පරිභෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාව සතු වාහන ඇණිය 09 ක් වූ අතර එයින් 02 ක් වෙන්කල වාහන විය. 2012 වර්ෂය තුලදී එම වාහන ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 142,358 ක් වූ අතර නඩත්තු වියදම රු. 1,889,328 ක් හා ඉන්ධන වියදම රු. 2,031,455 ක් විය. ඒ අනුව කිලෝ මීටරයකට දරන ලද නඩත්තුහා ඉන්ධන වියදම පිළිවෙලින් රු.13.27 ක් හා රු. 14.27 ක් විය.

(ආ) 2008 ජුලි 28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 50 ට අනුව වෙන්කල වාහන වෙනුවෙන් ගෙවිය යුතු උපරිම සීමාව ඉක්මවා ඉන්ධන ඇණවුම් මගින් ගෙවා තිබූ අතර වෙන්කරන ලද ඩීසල් වාහනය වෙනුවෙන් රු. 73,051 ක්ද වෙන් කරන ලද පෙට්‍රල් වාහනය වෙනුවෙන් රු. 44,291 ක්ද වශයෙන් රු.117,342 ක් වැඩිපුර ගෙවා තිබුණි.එනම් පිළිවෙලින් වැඩිපුර ඩීසල් ලීටර 664 ක් හා ප්‍රෙට්‍රල් ලීටර 301 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2013 අප්‍රේල් 10 දිනදීය.

### 4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණක තනතුර හැර එම අංශයට අදාල අනෙකුත් නිලධාරි තනතුරු 2001 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින බැවින් ඵලදායී කළමණාකාර්ත්ව පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ප්‍රමාණවත් දායකත්වයක් නොසපයන බව නිරීක්ෂණය විය.

### 4.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් / වියදම්,තථ්‍ය ආදායම්/ වියදම් සමග සැසඳීමේදී ආදායම්/ වියදම් කාණ්ඩ 16 ක් සම්බන්ධයෙන් විචලනය සියයට 50 ක ට වඩා වැඩි වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. එක් අවස්ථාවක අයවැය විචලනය සියයට 5703 ක් විය.

5. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා සංස්ථාවේ සභාපතිවරයාට වරින්වර පෙන්වා දෙන ලදී. පහත පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ණය ශේෂ අයකරගැනීම

(ආ) ආපසු ගෙවිය යුතු තැන්පතු

(ඇ) ආයෝජන

(ඈ) සුළු මුදල් අත්තිකාරම්

(ඉ) සිනමාශාලා ණය

(ඊ) සිනමාශාලා පරීක්ෂණ

(උ) සේවක ණය

(ඌ) ගිණුම්කරණය